# 17 අපේ වගකීම් හඳුනා ගනිමු

බුදු දහමින් අවධාරණය කෙරෙන වැදගත් ගුණාංගයක් ලෙස වගකීමෙන් කටයුතු කිරීම හඳුන්වා දිය හැකියි. එසේ ම එය මිනිස් සමාජයේ විධිමත් පැවැත්මට අදාළ කරුණක් ලෙස ද පුද්ගලයාගේ අභිවෘද්ධියට හේතු වන්නක් ලෙස ද දක්විය හැකි ය. බුදුරජාණන් වහන්සේ තම වගකීම මැනවින් ඉටු කළ ශාස්තෘවරයෙකි. එසේ ම සිවුවනක් පිරිස නමින් හැඳින්වෙන බෞද්ධ සමාජ කණ්ඩායම්වලට නිරතුරු ව උපදෙස් ලබා දී ඇත්තේ වගකීමෙන් කටයුතු කරන ලෙස ය. විශේෂයෙන් භික්ෂු සමාජය සඳහා මෙම කරුණ අවධාරණය කර ඇත. ප්‍රථම ධර්මදූත කණ්ඩායම අමතා අන්‍යයන්ට ධර්ම දේශනා කිරීමේ දී වගකීමෙන් යුක්ත ව එම කාර්යය ඉටු කරන ලෙස උපදෙස් ලබා දීම එක් නිදසුනකි.

දිනක් අප විදුහලේ ශිෂ්‍ය නායක නායිකාවන්ට පදක්කම් පැළඳවීමේ උත්සවයක් තිබිණ. එහි දී විශේෂ ආරාධිත අමුත්තා ලෙස වැඩම කළ ස්වාමීන් වහන්සේ අනුශාසනයක් පවත්වමින් මෙසේ සඳහන් කළහ.

"විදුහල්පතිතුමනි, ආචාර්ය මණ්ඩලයේ මහත්ම මහත්මීනි, ශිෂ්‍ය නායකයිනි, ශිෂ්‍ය නායිකාවනි, දරුවනි, දූරියනි, විශිෂ්ට ඉතිහාසයකින් යුක්ත වූ මෙම විදුහලේ ශිෂ්‍ය නායක නායිකාවන්ට පදක්කම් පැළඳවීමේ උත්සවයකට සහභාගි වීමට ශිෂ්‍යයින් කළ ආරාධනය පිළිගත්තේ තවත් යෙදී තිබුණු කටයුතු අවශේෂ සේ සලකා මෙවැනි උත්සවයකට විශේෂ තැනක් දිය යුතු බවට මා තුළ හැඟීමක් ඇති වූ බැවිනි."

අධ්‍යාපනයෙහි මූලික අරමුණක් වන්නේ වගකීමෙන් යුක්ත පුරවැසියන් බිහිකරලීමයි. එ බැවින් වගකීමෙන් බැහැර නොවී තමා වෙත පැවරෙන කාර්යයන් විශ්වාසවන්ත ව ඉටු කළ යුතු ව තිබෙනවා. පෙරටත් වඩා එය අද දවසේ ඉතාමත් වැදගත්. එසේ තම වගකීම් කොටස නොවලහා ඉටු වුවහොත් තමාගේත් පාසලේත් සමාජයේත් අභිවෘද්ධිය සැලසෙනවා. ඉතින් අද දින මෙම පාසලේ ශිෂ්‍ය නායකයින් උප නායකයින් වශයෙන් පදක්කම් ලැබූ ඔබට මෙම වගකීම් මොනවා දැයි පහදා දෙමින් කරුණු දැක්වීම මගෙන් සිදුවිය යුතු විශේෂ කරුණක් වශයෙන් මා සලකනවා.

බුදුරදුන් මෙන් ම බෝසතුන් ද මෙම වගකීම ආදර්ශයෙන් යුක්ත ව ඉටු කර ඇති බව අද දින පදක්කම් ලබන මෙම නායක නායිකාවන්ට පහදා දිය යුතු ව තිබෙනවා. යහපත් අරමුණක් වෙනුවෙන් තමා වෙත පැවරෙන කාර්යය නිවැරැදි ව ඉටු කිරීම සඳහා කැපවී කටයුතු කිරීම අපේ වගකීමයි. ජාතක පොතේ සඳහන් වන නළපාන ජාතකය මෙයට හොඳ නිදසුනකි.

මහ බෝසතාණන් වහන්සේ පාරමී පුරන සමයෙහි විශාල වානර රංචුවකට නායකත්වය දෙමින් ජීවත් වුණා. එක් දිනක් වනයෙහි ඇවිදින විට ප්‍රසන්න ජලය ඇති විලක් දකින්නට ලැබුණා. එම විලෙහි ජලය බීමට අවශ්‍ය බව රැලේ සිටි වානරයන්ගෙන් බහුතරයක් නායකයාට දැන්වූවා. විල පරීක්ෂා කර නායකයා පළමු ව වතුර බොන තෙක් කිසි ම වානරයකු විලට බැස්සේ නැහැ. ඔවුන් තම නායකයාට සැලකුවේ එහෙමයි. නායකයා විල හොඳින් පරීක්ෂා කර බැලුවා. විලට ජලය බීමට ගිය අයගේ මිස ආපසු ආ අයගේ කිසිදු පා සටහනක් දක්නට නො තිබෙන බව තීක්ෂණ බුද්ධියෙන් යුතු වානර නායකයාට දැක ගත හැකිවුණා. එය යක්ෂයකු අරක් ගත් විලක් බවට තේරුම් ගැනීමට වානර නායකයාට වැඩි වේලාවක් ගියේ නෑ. එහි ඇති අනතුර අන්‍යයන්ට පහදා දුන් නායකයා අසල වූ බට පඳුරකින් දිග බටයක් කඩා ගෙන එන ලෙස රැලේ වානරයකුට නියම කළා. එය රැගෙන ආපසු බටයේ එක් කෙළවරක් පොකුණට ද අනෙක් කෙළවර මුඛයට ද තබා ජලය උරමින් පානය කළා. මේ ආකාරයට ම සෙසු වානරයින් ද බට පඳුරකින් බටය බැගින් කඩා ගෙන අවුත් යහමින් ජලය පානය කළා. එම උපක්‍රමයෙන් කණ්ඩායමේ කිසිවකුටත් හානි නො වී සියලු දෙනාගේ ජීවිත බේරා ගැනීමට නායක වඳුරාට හැකිවුණා. මෙහි දී නායකත්වයේ වගකීම අකුරට ම ඉෂ්ට වුණා.

මෙම ජාතක කථාවේ දී වානර රංචුව කණ්ඩායමක් ලෙස වගකීමෙන් ක්‍රියා කළ අයුරු පෙන්වා දිය හැකි අතර යම් ආකාරයකින් නායකයා අනුව නොයා පොදු හැඟීමෙන් තොර ව ක්‍රියා කළේ නම් මහත් ව්‍යසනයක් වීමට ඉඩ තිබුණා. නායකත්වයේ වගකීම් ඉටු කළ අතර කණ්ඩායමේ අය ද සාමූහික වගකීමක් ඇතු ව නායකත්වයට කීකරු වූ අයුරු මෙහි දී දැක ගන්න පුළුවන්.

මෙහි දී නායකයා ප්‍රථමයෙන් ජලය පානය කළේ කරදරයක් වුවොත් එය තමාට ය යන අදහස සිහියේ තබා ගෙනයි. තමාට මෙන් ම පිරිවරට ද කරදරයක් නො වන තැනට එමඟින් කටයුතු කළ හැකි වුණා.



නායකයාගේ උපදෙස් පරිදි ක්‍රියාකිරීමට හැමෝ ම එකඟ වී සිටියා. ඒ අනුව ඔවුන් කවුරුවත් පළමු ව විලට බැස්සේ නැහැ. නායකයාට නො කියා වතුර බීමට ගියෙත් නැහැ. නායකයාට කලින් වතුර බීමට ගියෙත් නැහැ. අද කාලයේ ඕනෑ ම තරාතිරමක නායකයන්ටත් එවැනි අනුගාමිකයන් සිටිනවා නම් එය කොතරම් කාලෝචිත දැයි මොහොතකට සිතා බලන්න. නායකත්වයේ වගකීම දැරීමට එය කොතරම් පිටුවහලක් දැයි සිතා බැලීම ඔබට භාර කරනවා.

ශිෂ්‍ය නායක නායිකාවන් තමන් ක්‍රියා කළ යුත්තේ කෙසේ ද තම අනුගාමිකයින් ක්‍රියා කළ යුත්තේ කෙසේ ද කියා සිතන්න ඕනෑ. තම නායකත්වය යටතේ සිටින්නන් ද නායකත්වයට පිටුපා ක්‍රියා නොකරන තත්ත්වයන්ට හුරු කර ගත යුතු වෙනවා. ඒ ආකාරයේ නායකත්වයක් වගකීමෙන් යුතු ව ඉටුකිරීමට තිබෙන බව මම මේ අවස්ථාවේ දී අද පදක්කම් ලැබූ සියලු දෙනාටමත් ඒ අයගේ අනුගාමිකයන් වීමට සිටින අනිකුත් දරු දැරියනටත් මතක් කර දෙනවා.

අප බුදුරජාණන් වහන්සේ තමාට උරුම වූ වගකීම් දරමින් ඒවා ඉටු කරමින් අනුපමේය සේවාවක් කළ බව ඔබ දන්නවා. තථාගතයන් වහන්සේ තමන් බුද්ධත්වයට පත්වූ තැන් පටන් පරාර්ථ සේවය සඳහා ගම් නියම්ගම්හි සැරිසරමින් ධෛර්ය සම්පන්න ව ක්‍රියා කළා. බුදුරජාණන් වහන්සේ එක් තැනක වාසය කළා නම් ඒ වැසි සහිත භාර මාසය පමණයි. අවුරුද්දේ අන් සෑම කාලයෙහි ම දඹදිව විවිධ ප්‍රදේශවල සැරිසරමින් දහම් දෙසමින් ලොවට ඉටුවිය යුතු වගකීම් සම්භාරය මැනවින් ඉටු කළා.

සතළිස් පස් වසක් තුළ බුදුරජාණන් වහන්සේ සිවුවනක් පිරිසට ධර්මාවබෝධය සලසමින් චාරිකාවේ යෙදුණා. මහාපරිනිර්වාණ සූත්‍රයේ සඳහන් වන පරිදි බුදුරජාණන් වහන්සේ හමුවට පැමිණ මාර දිව්‍ය පුත්‍රයා 'දැන් ඔබ වහන්සේ පිරිනිවන් පෑමට සුදුසු කාලය පැමිණ තිබෙන බැවින් පිරිනිවන් පාන්නැ' යි ඉල්ලීමක් කළා. මෙහි දී මාර දිව්‍ය පුත්‍රයා ඇමතූ බුදුරජාණන්

වහන්සේ තමන්ගේ සිවුවනක් පිරිසට ම ධර්මය පිළිබඳ නිපුණතාව ඇති වන තුරු පිරිනිවන් නොපාන බව උන්වහන්සේ අවධාරණය කළා. ඒ තම වගකීම හඳුනාගෙන ක්‍රියා කළ බවට සාධකයෙකි. දුකට පත් මිනිසාහට විමුක්ති මාර්ගය පෙන්වා දීම සඳහා තම ධර්ම දූත කණ්ඩායම් පිටත් කර හැර තමන් වහන්සේ ද චාරිකාවෙහි හැසිරෙමින් සම්බුදුපියාණන් තමන්ගේ වගකීම මැනවින් ඉටුකර ලීමට ගත් උත්සාහය පෙනෙනවා.

ශාසනයෙහි අග්‍ර උපස්ථායක තනතුර භාරගැනීමට පෙර ආනන්ද හිමියන් ප්‍රතික්ෂේප හතරක් සහ ආයාචනා හතරක් ඉදිරිපත් කර තනතුර ලැබුණු පසු තථාගතයන් වහන්සේට දැහැටි, උණු පැන් සපයා දීම, පා සේදීම, ස්නානය කරවීම, ගඳකුටිය ශුද්ධ පවිත්‍ර කිරීම, ඇඳ ඇතිරිලි සකස් කිරීම ආදී කටයුතු නොපිරිහෙලා ඉටු කළා. බුදුරජාණන් වහන්සේට සිදු විය හැකි විපත් කරදරවලින් මුදවා ගැනීම පිණිස ආනන්ද තෙරණුවන් ඉදිරිපත් වූයේ තම ජීවිතය පවා දෙවන කොට සලකාගෙන, දෙව්දත් තෙරුන්ගේ මෙහෙයවීම මත බුදුරජාණන් වහන්සේ මැරවීමට නාලාගිරි ඇතුට රා පොවා පෙරමගට එවූ අවස්ථාවේ ආනන්ද තෙරණුවන් නිර්භීත ව ඇත්රාජයා ඉදිරියට වැඩම කළේ ජීවිත පරිත්‍යාගයෙන් බුදුරජාණන් වහන්සේ බේරා ගැනීමේ අදහසිනි. එයින් තමාගේ වගකීම ඉටුකිරීමට මොන තරම් කැපවීමක් කළේ දැයි සිතා ගැනීමට අපට පුළුවන්.



ධර්ම භාණ්ඩාගාරික තනතුර දරමින් තථාගතයන් වහන්සේ දෙසූ ශ්‍රී සද්ධර්මය මතකයේ තබා ගත හැකි ධාරණ ශක්තියක් ද ආනන්ද තෙරණුවන්ට තිබුණා. උන් වහන්සේ දහම් දෙසූ අවස්ථාවල දී, මහණෙනි, මෙම ධර්ම කරුණු මා විසින් විස්තර කරනු ඇත්තේ ද මේ අයුරින් ම යැයි ආනන්ද හිමියන් අගය කළ බුදුරජාණන් වහන්සේ ද විටෙක වදාළා.

කොතරම් අග තනතුරු ලබා හිටියත්, බුදුරජාණන් වහන්සේ ඉතා සමීපයෙන් ආශ්‍රය කළත් ඒ කිසිවකින් උද්දාමයට පත් නොවූ ආනන්ද තෙරණුවෝ සිය කාර්යයන් වගකීමෙන් යුක්ත ව ඉටු කිරීමට අවශ්‍ය පසුබිම මුලින් ම සකසා ගත් අයුරු ප්‍රතික්ෂේප සතර සහ ආයාචනා වර සතරෙන් පෙනෙනවා.

බුදු සසුනේ අග්‍ර දායිකාව වූ විශාඛාව බොහෝ විට කාන්තා ප්‍රශ්න නිරාකරණය සඳහා මැදිහත් වූ අතර භික්ෂුණීන් වහන්සේලා අතර විනය ප්‍රශ්න විසඳීමට ද ඇතැම් විටෙක ඇයට ආරාධනය ලැබුණා. පෙහෙවස් සමාදන් වූ උපාසිකාවන්ට නිසි උපදෙස් දීමට ඇය ඉදිරිපත් වූ වාර බොහොමයකි. විශාඛා තොමෝ භික්ෂු - භික්ෂුණී, උපාසක - උපාසිකා යන සිවු පිරිසට ම ප්‍රයෝජනවත් වන උදාර සමාජ මෙහෙවරක කැපවීමෙන් යුක්ත ව යෙදෙමින් පැවරූ වගකීම ඉටුකරමින් විශිෂ්ට සේවාවක් ඉටු කළා.

බුද්ධ ශාසනයෙහි අගසව් තනතුර දරූ සැරියුත් මුගලන් දෙනම ඉතාමත් කැපවීමෙන් යුක්ත ව දුකට පත් මිනිසුන් සංසාර සාගරයෙන් එගොඩ කිරීම සඳහා බුදු වදනට අනුව තමන් වහන්සේලාට පැවරෙන වගකීම ඉටුකළා. ශාසනික චිරස්ථිතිය වෙනුවෙන් මුළු භික්ෂු සංහතිය ම එක අරමුණක් කරා මෙහෙයවා තම තමන් ගේ වගකීම් පහදා දෙමින්, එම අගසව් මහ රහතන් වහන්සේලා පෙන්වා දුන් මාර්ගයේ ම ගමන් ගනිමින් අද දිනයේත් සංඝ සමාජය ලෝක සත්ත්වයාගේ හිතසුව පිණිස කැප වෙනවා.

මෙම ආදර්ශ, පාසලට ද පොදුයි. අද දින පදක්කම් ලබා ගත් නායක නායිකාවනි, අනිකුත් දරුවනි, දූරියනි, තම වගකීමෙන් බැහැර නො වී තමා වෙත පැවරෙන කාර්යයන් විශ්වාසවන්ත ව ඉටු කරමින් අනිකුත් සහෝදර සහෝදරියන් යහමාර්ගයෙහි යැවීම සඳහා ඔබගේ වගකීම ඉටු කරන අයුරු පාසලත් ඒ අවට සමාජයත් ඕනෑ කමින් බලා සිටින බව සිහිපත් කළ යුතුයි. ඒ බව සිතට ගෙන ඔබගේ අධ්‍යාපන කටයුතුත් සමඟ නායකත්වයේ කාර්ය භාරයන් ඉටු කරනු ඇතැයි අප අපේක්ෂා කරනවා. එයින් ඔබගේ අභිවෘද්ධිය සැලසෙනවා. අද දින පත්වූ ශිෂ්‍ය නායක නායිකාවන් තම වගකීම තේරුම් ගෙන කටයුතු කරනු ඇතැයි සිතමින් යහපත් සාමකාමී සදාචාර සම්පන්න අනාගතයක් සැමට ම ප්‍රාර්ථනා කරමින් අනුශාසනාව හමාර කරනවා.

ඔබ සියලු දෙනාට ම තෙරුවන් සරණයි !

**සාරාංශය**

වගකීම් දැරීම හා ඒ තුළින් ප්‍රජාවට මහත් වූ සේවාවක් සැලසීම සඳහා බුදුදහමින් උපදෙස් රාශියක් ලබා ගත හැකි වේ. වගකීම් දැරීම සුළු කොට තැකීම නිසා සමාජයට සිදු වන අයහපත තේරුම් ගත යුතු ය. සමාජයේ ජීවත් වන හැමදෙනා ම තම තමන්ට පැවරෙන වගකීම හොඳින් දැරීමෙන් වඩාත් හොඳ ජීවන තත්ත්වයක් අප කාටත් ළඟා කර ගත හැකි වෙයි.

**ක්‍රියාකාරකම**

1. සැරියුත් මුගලන් අගසව් දෙනම ගෞතම බුද්ධ ශාසනය වෙනුවෙන් තම වගකීම ඉටු කළ අවස්ථා විස්තර කොට බිත්ති පුවත් පතකට ලිපියක් සකස් කරන්න.
2. ශිෂ්‍යයකුගේ අනාගත ජීවිතය වඩාත් අර්ථාන්විත කිරීම සඳහා ශිෂ්‍ය නායකයකු වශයෙන් ඔබ ලබාදෙන උපදෙස් සතරක් ලියන්න.
3. නළපාන ජාතකය රඟ දක්වන්න.

**පැවරුම**

ශිෂ්‍ය නායක කඳවුරක් හොඳින් සංවිධානය කර පවත්වාගෙන යාමට අදාළ වන සැලැස්මක් ගුරු සහාය ද ඇති ව සකස් කරන්න.